*සැ. යු.*- 2013.11.08 දින පළ වූ අංක 1,836 දරන ගැසට් පත්‍රයේ I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,837 - 2013 නොවැම්බර් මස 15 වැනි සිකුරාදා - 2013.11.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1801 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 දෙසැම්බර් මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 නොවැම්බර් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

**රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**වෙරළ සංරක්ෂණ සේවයේ III පන්තියේ වෙරළ සංරක්ෂණ නියාමක තනතුරට බඳවා ගැනීම - 2013**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ සේවයේ III පන්තියේ වෙරළ සංරක්ෂණ නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (උතුරු හා නැගෙනහිර පළාත්වලට අනුයුක්ත කිරීම ඇතුළුව).

02. *සේවා කොන්දේසි :*

රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව වෙරළ සංරක්ෂණ සේවයේ III පන්තියේ වෙරළ සංරක්ෂණ නියාමක තනතුරට බඳවා ගනු ලැබේ.

2.1 තෝරා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

2.2 පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කරන ලද නිලධාරියකු පත් කරනු ලැබුවහොත් එක් අවුරුදු පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ.

2.3 පත්වීම ස්ථිර කිරීම සඳහා පත්වීම් දින සිට තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

2.4 තනතුරට බඳවා ගැනීමෙන් පසු වසර 05ක් ඇතුළත 2007.05.28 දිනැති රා. පරි. 07/2007 චක්‍රලේඛයේ විධිවිධාන පරිදි අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.

2.5 පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

2.6 දෙමළ භාෂාවෙන් රාජකාරි කිරීමට ද හැකිවිය යුතු ය.

2.7 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

2.8 ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වන වගන්ති අදාළ වේ.

03. *වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව, වැටුප් ක්‍රමය MN- 1-2006 - A

රු. 13,120-10x 145-11x170-10x240-10x320-රු. 22,040 ක් වන මාසික වැටුපක් හිමි වේ.

04. *වයස් සීමාව :*

4.1 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

4.2 ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

4.3 යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

05. *අධ්‍යාපන සුදුසුකම් :*

5.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

සහ

5.2 අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනීසිටිය යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේදී එක් එක් අයදුම්කරුවන් විසින් ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

07. අයදුම්පත් එවිය යුතු ආකාරය :

7.1 මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම යොදාගෙන, පළමු පිටුවෙහි අංක 01 සිට 06 දක්වාත් ඉතිරි කොටස අනික් පිටුවලටත් ලෙස සකස් කරන ලද ඉල්ලුම්පත්‍රය 2013 දෙසැම්බර් මස 06 වැනි දිනට හෝ එදිනට පෙර, අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " වෙරළ සංරක්ෂණ සේවයේ III පන්තියේ වෙරළ සංරක්ෂණ නියාමක තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

*සටහන :* රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

7.2 සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

7.3 අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට දින 07කට කලින් කැඳවීමේ ලිපිය නොලැබුනහොත් පහත සඳහන් විස්තර සහිතව වහාම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතු ය.
(i) අයදුම්කරුගේ සම්පූර්ණ නම;
(ii) ලිපිනය.

08. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.
(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික.

*සාවද්‍ය තොරතුරු සැපයීම.*—මෙම සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් වීම සඳහා යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්‍ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වෙන අතරතුර හෝ සම්මුඛ පරීක්‍ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්‍ෂකත්වය අවලංගු කිරීමට හැකිවන්නේ ය. අපේක්‍ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේ ය.

09. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණය ගැනීමේ බලය වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්‍ෂ ජනරාල් සතු වේ.

ආචාර්ය අනිල් ප්‍රේමරත්න,
වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත්
කළමනාකරණ අධ්‍යක්‍ෂ ජනරාල්.

2013 ඔක්තෝබර් මස 25 වැනි දින,
මාලිගාවත්ත,
වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ
දෙපාර්තමේන්තුවේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

*රාජ්‍ය ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය*

**වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙරළ සංරක්‍ෂණ සේවයේ III පන්තියේ වෙරළ සංරක්‍ෂණ නියාමක තනතුරට බඳවා ගැනීම - 2013**

[ ] (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. නම :

1.1 මුල්කුරු අගට යොදා මුල්කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්, උදා : SILVA A. B.)
1.2 මුල්කුරු වලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

02. ලිපිනය :
2.1 පෞද්ගලික :————.
2.2 කාර්යාලීය :————.

03. 3.1 පදිංචි දිස්ත්‍රික්කය :————.
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
3.3 ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :————.

04. 4.1 උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

4.2 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

05. 5.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී : [ ]
පුරුෂ : [ ]

5.2 විවාහක/අවිවාහක/වැන්දඹු ද : විවාහක : [ ]
අවිවාහක : [ ]
වැන්දඹු : [ ]

06. *අධ්‍යාපන සුදුසුකම් :*

6.1 අ. පො. ස. (සා/පෙළ) :

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

(සහතික පිටපත් අමුණා ඇත.)

6.2 අ. පො. ස. (උ/පෙළ) :

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

(සහතික පිටපත් අමුණා ඇත.)

07. *වෙනත් සුදුසුකම් :*

| පාඨමාලාවේ නම | පාඨමාලාව හදාරන ලද ආයතනය | පාඨමාලාවේ කාලසීමාව | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

(සහතික පිටපත් අමුණා ඇත.)

08. භාෂා කුසලතාවය පිළිබඳ විස්තර :-

| භාෂාව | කියවීම | ලිවීම | කථා කිරීම |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

(සහතික පිටපත් අමුණා ඇත.)

09. පරිගණක හැකියාව පිළිබඳ විස්තර :-

| සහතික | සහතික නිකුත් කළ ආයතනයේ නම | වර්ෂය | විෂයය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

(සහතික පිටපත් අමුණා ඇත.)

10. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද සියලුම තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වුත් ඒවා බව මෙයින් සහතික කරමි. මා මෙම තනතුරට තෝරාගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා පමණක් අදාල වේ.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

නිලධාරියා විසින් සපයා ඇති විස්තර පරීක්‍ෂා කර බැලුබවත්, ඒවා නිවැරදි බවත්, නිලධාරියා ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-446/1

---

**රාජ්‍ය ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**දෙපාර්තමේන්තුගත සේවයේ III පන්තියේ ක්‍ෂේත්‍ර කම්කරු තනතුරට බඳවා ගැනීම - 2013**

වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත සේවයේ III පන්තියේ ක්‍ෂේත්‍ර කම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (උතුරු හා නැගෙනහිර පළාත් වලට අනුයුක්ත කිරීම ඇතුළුව).

02. *සේවා කොන්දේසි :*

රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව දෙපාර්තමේන්තුගත සේවයේ III පන්තියේ ක්‍ෂේත්‍ර කම්කරු තනතුරට බඳවා ගනු ලැබේ.

2.1 තෝරා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

2.2 පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කරන ලද නිලධාරියකු පත් කරනු ලැබුවහොත් එක් අවුරුදු පරීක්‍ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ.

2.3 පත්වීම ස්ථිර කිරීම සඳහා පත්වීම් දින සිට තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත් විය යුතු ය.

2.4 තනතුරට බඳවා ගැනීමෙන් පසු වසර 05ක් ඇතුළත 2007.05.28 දිනැති රා. පරි. 07/2007 චක්‍රලේඛයේ විධිවිධාන පරිදි අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.

2.5 පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

2.6 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

2.7 ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වන වගන්ති අදාළ වේ.

03. *වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව, වැටුප් ක්‍රමය PL-1-2006 - A

රු. 11,730-10x 120-10x130-10x145-12x160-රු. 17,600 ක් වන මාසික වැටුපක් හිමිවේ.

04. *වයස් සීමාව :*

4.1 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩුවිය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

4.2 ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

4.3 යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

05. *අධ්‍යාපන සුදුසුකම් :*

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරක දී විෂයයන් හයකට නොඅඩුව සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත්වී තිබිය යුතු ය.

*06. බඳවා ගැනීමේ ක්‍රමය :*

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයට පෙනීසිටිය යුතු ය.

සම්මුඛ පරීක්‍ෂණයේ දී එක් එක් අයදුම්කරුවන් විසින් ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

07. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

7.1 මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම යොදාගෙන, පළමු පිටුවෙහි අංක 01 සිට 06 දක්වාත් ඉතිරි කොටස අනික් පිටුවලටත් ලෙස සකස් කරන ලද ඉල්ලුම්පත්‍රය 2013.12.06 වැනි දිනට හෝ එදිනට පෙර අධ්‍යක්‍ෂ ජනරාල්, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ" දෙපාර්තමේන්තුගත සේවයේ III පන්තියේ ක්ෂේත්‍ර කම්කරු තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

සටහන : රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

7.2 සෑම ආකාරයකින් ම සම්පූර්ණ වී නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

7.3 අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට දින 07කට කලින් කැඳවීමේ ලිපිය නොලැබුනහොත් පහත සඳහන් විස්තර සහිතව වහාම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතු ය.

(i) අයදුම්කරුගේ සම්පූර්ණ නම

(ii) ලිපිනය

08. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය;

(ii) අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික.

*සාවද්‍ය තොරතුරු සැපයීම* : මෙම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණයවුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අතරතුර හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකිවන්නේ ය. අපේක්ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේ ය.

09. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණය ගැනීමේ බලය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

ආචාර්ය අනිල් ප්‍රේමරත්න,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්
කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්.

2013 ඔක්තෝබර් මස 25 වැනි දින,
මාලිගාවත්ත,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය*

**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**
**දෙපාර්තමේන්තුගත සේවයේ III පන්තියේ ක්ෂේත්‍ර කම්කරු තනතුරට**
**බඳවා ගැනීම - 2013**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. නම :

1.1 මුල්'කුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්, උදා : SILVA A. B.)

1.2 මුල්'කුරු වලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

02. ලිපිනය :

2.1 පෞද්ගලික :————.

2.2 කාර්යාලීය :————.

03. 3.1 පදිංචි දිස්ත්‍රික්කය :————.

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

3.3 ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :————.

04. 4.1 උපන්දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

4.2 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. 5.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐
පුරුෂ ☐

5.2 විවාහක/අවිවාහක/වැන්දඹු ද : විවාහක ☐
අවිවාහක ☐
වැන්දඹු ☐

06. අධ්‍යාපන සුදුසුකම් :

6.1 අ. පො. ස. (සා/පෙළ) :

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

(සහතික පිටපත් අමුණා ඇත.)

07. වෙනත් සුදුසුකම් :

| *පාඨමාලාවේ නම* | *පාඨමාලාව හදාරන ලද ආයතනය* | *පාඨමාලාවේ කාලසීමාව* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

(සහතික පිටපත් අමුණා ඇත.)

08. භාෂා කුසලතාවය පිළිබඳ විස්තරය :

| *භාෂාව* | *කියවීම* | *ලිවීම* | *කථා කිරීම* |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

(සහතික පිටපත් අමුණා ඇත.)

09. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද සියලුම තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වුත් ඒවා බව මෙයින් සහතික කරමි. මා මෙම තනතුරට තෝරාගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

නිලධාරියා විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූබවත්, ඒවා නිවැරදි බවත්, නිලධාරියා ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-446/2

---

**වෙළඳ නාවික කටයුතු අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලය**
**මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය**

මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයේ, වෙළඳ නාවික කටයුතු අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලයේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *බඳවා ගන්නා ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) | II ශ්‍රේණිය | 01 |

1. *සුදුසුකම් හා පළපුරුද්ද* :
*අධ්‍යාපන සුදුසුකම්.*—සමුද්‍රීය ඉංජිනේරු මුරකාවල කාර්යභාර නිලධාරී (සීමා රහිත) සහතිකය ලබා තිබීම.

*පළපුරුද්ද.*—කිලෝ වොට් 300ට වැඩි ධාරිතාවයක් ඇති සාගර තරණයෙහි යෙදෙන වෙළඳ නෞකාවක මුරකාවල කාර්යභාර ඉංජිනේරු නිලධාරියෙකු ලෙස වසර 02ක අවම පළපුරුද්ද.

2. *කායික සුදුසුකම්.*—සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. තෝරා ගන්නා අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

3. *වෙනත් සුදුසුකම්* :
i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එසේ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. වයස් සීමාව.—අවම සීමාව - අවුරුදු 21ට නොඅඩු, උපරිම සීමාව - අවුරුදු 45ට නොවැඩි
(දැනටමත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

5. *වැටුප් පරිමාණය.*—රු. 16720 - 10x320 - 11x365 - 15 x 450 - රු. 30,685

6. බඳවා ගැනීමේ ක්‍රමය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර, පහත දක්වා ඇති ලකුණු පටිපාටියට අනුව ලකුණු ලබාදෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

| | *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 02. | වෘත්තීය සුදුසුකම් | 25 |
| 03. | අතිරේක පළපුරුද්ද (බඳවා ගැනීමේදී සලකා බලනු ලබන පළපුරුද්දට අමතරව) | 20 |
| 04. | ඉංග්‍රීසි භාෂා කුසලතාවය | 10 |
| 05. | පරිගණක සාක්ෂරතාව | 10 |
| 06. | සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය සඳහා | 05 |
| | | 100 |

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.

7. *ඉල්ලුම් කළ යුතු ආකාරය* :

(i) මෙම ගැසට් නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2013.12.17 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ නාවික කටයුතු අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලය, අංක 43-89, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල, 1 වැනි මහල, යෝක්වීදිය, කොළඹ 01 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය.

(ii) රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

"වෙළඳ නාවික අධ්‍යක්‍ෂ ජනරාල්"
වෙළඳ නාවික කටයුතු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ කාර්යාලය,
මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය,
පළමු මහල, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල,
අංක 43-89, යෝක් වීදිය,
කොළඹ 01.

2013 නොවැම්බර් මස 15 වැනි දින.

වෙළඳ නාවික කටයුතු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ කාර්යාලයේ සහකාර රාජ්‍ය නෞකා සමීක්‍ෂක (ඉංජිනේරු) තනතුර සඳහා අයදුම් පත්‍රය

(1) සම්පූර්ණ නම :—————.

(2) ලිපිනය :—————.

(3) දුරකථන අංකය :—————.

(4) උපන් දිනය :—————.
2013.11.15 දිනට වයස ඃ අවු. :—————. මාස :—————.
දින :—————.

(5) ජාතිකත්වය :—————.

(6) අධ්‍යාපන සුදුසුකම් :—————.

(7) වෘත්තීය සුදුසුකම් :—————.

(8) රැකියා හා පුහුණු සම්බන්ධ තොරතුරු :—————.

(9) වර්තමාන රැකියාව :—————.

මා විසින් මෙම අයදුම්පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් කිසියම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව මෙම වරද දැන ගැනීමට ලැබුණහොත් කිසිඳු වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට බැඳී ඇති බවද මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

11-498

---

## ප්‍රවාහන අමාත්‍යාංශය

## නීති නිලධාරි (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

ප්‍රවාහන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරු එකක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* ඃ

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්‍ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* ඃ

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* ඃ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

(ii) *පළපුරුද්ද* ඃ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් තිබීම.

(iii) *කායික සුදුසුකම්* ඃ

සෑම අපේක්‍ෂයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) *වෙනත්* ඃ
* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
* අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
* අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* ඃ

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයට යටත්ය. නීති නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමු වැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 ට අනුව තනතුරට බැඳී වසර පහක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.

(iv) මෙම පත්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 සහ 2009.02.20 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව* ඃ

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* ඃ
මෙම තනතුරට රු. 22,935-10x645-8x790-17x1050-රු. 53,555 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රා. ප. චක්‍රලේඛ අංක 6/2006 අනුව SL1-2006 වැටුප් ඛණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කරගනු ලැබේ. :-

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | *අතිරේක අධ්‍යාපන සුදුසුකම් :* | | 20 |
| | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ උපාධිය හෝ නීතිවිද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02 | *අතිරේක වෘත්තීය සුදුසුකම් :* | 15 | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | | |
| | (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | | |
| | (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | (එක් ඩිප්ලෝමාවකට ලකුණු 02 බැගින්) | | |
| 03 | *අතිරේක පළපුරුද්ද :* | 30 | |
| | නීතිඥවරයකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද - එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක් | | |
| | (මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර) | | |
| | (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයකුගෙන් ලබා ගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය. | | |
| 04. | *පරිගණක සාක්ෂරතාව :* | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | | |
| | රජයේ පිළිගත් ආයතනයක මාස 06කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | | |
| | රජයේ පිළිගත් ආයතනයක මාස 03කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| 05. | *ඉංග්‍රීසි භාෂාව ප්‍රවීනතාව :* | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය | 15 | |
| | (අදාළ විභාග ප්‍රශ්නපත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය.) | | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 05 | |
| 06 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | | 05 |
| | මුළු එකතුව | | 100 |

*සටහන :-*

(i) අයදුම්කරුවන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙර සියලුම සුදුසුකම් සපුරාලිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අය පමණි.

(ii) සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

07. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. (අ) අයදුම්පත් 2013.12.15 වැනි දින හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
ප්‍රවාහන අමාත්‍යාංශය,
අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 08 දක්වාත්, දෙවන පිටුව අංක 09 සිට 15 දක්වාත් තුන්වන පිටුව අංක 16 සිට 17 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ප්‍රවාහන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඇ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මෙහි සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධව අවසාන තීරණය ගැනීමේ අයිතිය හා පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
ප්‍රවාහන අමාත්‍යාංශය.

අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**
***ප්‍රවාහන අමාත්‍යාංශය***

අයදුම් කරන තනතුර : නීති නිලධාරි තනතුර

(1) (i) මුලකුරු සමග අගට යෙදෙන නම (සිංහල) :—————.
(ii) මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි) :—————.
(iii) මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහල) :—————.
(iv) මුලකුරු වලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි) :—————.

(2) ලිපිනය :

(i) රාජකාරි :—————.
(ii) පෞද්ගලික :—————.

(3) දුරකතන අංකය :
(i) රාජකාරි :—————.
(ii) පෞද්ගලික :—————.

(4) (i) වර්තමාන තනතුර හා සේවා ස්ථානය :—————.
(ii) එම තනතුරට පත් වූ දිනය :—————.

(5) ජාතික හැඳුනුම්පත් අංකය :—————.

(6) (i) ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
(ii) විවාහක ද, අවිවාහක ද, වැන්දඹු ද යන වග

(7) (i) උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

වර්ෂ :—————. මාස :—————. දින :————.

(8) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද?

(9) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

(අ) සාමාර්ථය, වෘත්තීය හා/හෝ ශිල්පීය සුදුසුකම් යනාදියේ විස්තර ද සමග සඳහන් කරන්න.

| *විභාගය* | *වර්ෂය* | *පෙනිසිටි ප්‍රධාන විෂයයන්* | *සාමාර්ථය* | *ආයතනයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

(ආ) අදාළ අයදුම්කරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් වර්ෂය :—————.

(ඇ) අයදුම්පත් කැඳවන අවසාන දිනට නීතිඥයකු වශයෙන් සේවය කළ කාලය :—————.

(10) පළපුරුද්ද ‍:

(i) ආයතනය :—————.
(ii) සේවා කාලය :—————.

(11) පරිගණක ක්ෂේත්‍රයේ පළපුරුද්ද :—————.

(12) වෙනත් සුදුසුකම් :—————.

(13) ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාව :—————.

(14) වෙනත් අදාළ විය හැකි තොරතුරු :—————.

(15) අයදුම්කරු විසින් මීට පෙර කිසිදු අපරාධයක් සඳහා උසාවියේ පෙනී සිට ඇත් ද? එසේ පෙනී සිටින ලද්දේ නම් ඒ සම්බන්ධව විස්තර :—————.

(16) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි V වැනි පරිච්ඡේදය අනුව රාජ්‍ය සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන් නොවිය යුතුය යන්න :—————.

(17) ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

(18) *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

ප්‍රවාහන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................. නැමැති අය මා පෞද්ගලික වශයෙන් හඳුනන බවත්, 2013 ......... මස ......... දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් ප්‍රකාශ කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.

ස්ථානය :—————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :—————.
ලිපිනය :—————.
නිල මුද්‍රාව :—————.

(19) *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය* :

ප්‍රවාහන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කරන මෙම ආයතනයේ ................. තනතුර දරන ..................... මයා./මිය./මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූලව කටයුතු කිසිවක් සිදුකර නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නැති බවත් සහතික කරමි. ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක./නොහැක.

—————,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

(නිලමුද්‍රාව)

11-539

---

## නිවැරදි කිරීමයි

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පොත් බැඳුම්කරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2013

2013.11.08 වැනි දින අංක 1836 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටස II(ආ) ඡේදයේ තනතුරු ඇබෑර්තු යටතේ ඉහත සඳහන් දෙපාර්තමේන්තුව යටතේ පළ කරන ලද නිවේදනයේ, අංක 06 සුදුසුකම් යටතේ :

2013.11.19 වැනි දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය යන්න වැරදි ලෙස පළ වී ඇත. එය 2013.11.29 වැනි දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය ලෙස නිවැරදි විය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 නොවැම්බර් මස 08 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

11-760

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.